කාර්යසාධන වාර්තාව
2025

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මහලේකම් කාර්යාලය, කොළඹ 01

011 2484816

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මහලේකම් කාර්යාලය

කොළඹ 01

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ආයතනයේ නම : කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය : 324

<u>පටුන</u>

අන්තර්ගතය අංකය	පිටු
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-5
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	6-8
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	9-18
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	19-20
පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	21-25
පරිච්ඡේදය 06 - අවදානම් කළමනාකරණ රාමුව	26-30
පරිච්ඡේදය 07 - උපායමාර්ගික සැලැස්ම (2026-2030)	31-48
පරිච්ඡේදය 08 - මානව සම්පත් පැතිකඩ	49-52
පරිච්ඡේදය 09 - අනුකූලතා වාර්තාව	53-62

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2008.01.25 දිනැති අංක 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇති අතර, භාණ්ඩාගාරය විසින් රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදාහරිනු ලබන අරමුදල් ඵලදායි ලෙස යෙදවීම තහවුරු කිරීම සඳහා වන අභ්‍යන්තර පාලන විධි ශක්තිමත් කිරීම මෙහි අරමුණ වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

ඉහළ කාර්ය සාධනයක් සහ වගකීම් සහගත රාජ්‍ය සේවයක් අභිවර්ධනය කිරීම සඳහා කැප වූ, අඛණ්ඩව අගය එකතු කරන විශිෂ්ටතම විගණන කළමනාකරණ සහ අධීක්ෂණ ආයතනය බවට පත්වීම.

1.2.2. මෙහෙවර

අභ්‍යන්තර පාලනය සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය අංශයට මාර්ගෝපදේශ සහ සහාය ලබා දීම.

අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා දායකවීම.

2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.

3. අභ්‍යන්තර විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.

4. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

5. විශේෂ විමර්ශන හරහා රාජ්‍ය අංශයේ සිදුවී ඇති අක්‍රමිකතා හෙළිදරව් කිරීම සහ එවැනි අක්‍රමිකතා අනාගතයේදි ඇතිවීම වලක්වා ගැනීම හා එවැනි තත්ත්වයන් මගහැර ගැනීම සඳහා වැළැක්වීමේ පියවර සහ නිර්දේශ හඳුන්වා දීම.

1.3 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

1. කාර්යක්‍ෂම හා සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රියාවලි හඳුන්වාදීම.
2. අභ්‍යන්තර පාලනය සම්බන්ධ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම.
3. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාළ මඟපෙන්වීම් ලබා දීම.
4. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
5. අමාත්‍යාංශ,විශේෂ වියදම් ඒකක,පළාත් සභා,දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සහ ව්‍යාපෘති අභ්‍යන්තර සමාලෝචන කමිටුවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම සහ මඟපෙන්වීම.
6. විශේෂ විමර්ශන හා විශේෂ විගණන කටයුතු සිදුකිරීම.
7. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ භාණ්ඩාගාර වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම.
8. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
9. දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

1.4 2025.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රා.ගි.කා.ස.) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ගිණුම් කාරක සභා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වි.ක.ක) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (විගණන හා කළමණාකරණ කමිටු)
අධ්‍යක්ෂ (ප.ස.ස) - අධ්‍යක්ෂ (පළාත් සභා සම්බන්ධීකරණය)
අධ්‍යක්ෂ (අ.වි.වා.ස.) - අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය)
අධ්‍යක්ෂ (දේ.ව්‍යා / වි.ව්‍යා) 1 - අධ්‍යක්ෂ (දේශීය ව්‍යාපෘති/විදේශීය ව්‍යාපෘති) 1
අධ්‍යක්ෂ (දේ.ව්‍යා / වි.ව්‍යා) 2 - අධ්‍යක්ෂ (දේශීය ව්‍යාපෘති/විදේශීය ව්‍යාපෘති) 2
අධ්‍යක්ෂ (ප්‍ර.ස.) - අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සම්පාදනය)
අධ්‍යක්ෂ (රා.ව්‍යා) - අධ්‍යක්ෂ (රාජ්‍ය ව්‍යාපාර)

1.5 2025.12.31 දිනට කාර්ය මණ්ඩලය

තනතුර	කාර්ය මණ්ඩලය		
	අනුමත	තත්‍ය	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ග.සේ. විශේෂ ශ්‍රේණිය)	01	01	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය)	01	01	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ග.සේ. විශේෂ ශ්‍රේණිය.)	02	02	-
අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.)	01	01	-
අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ග.සේ.)	04	02	02
අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ.)	02	02	-
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.)	01	-	01
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ග.සේ.)	04	03	01
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ.)	01	-	01
සංවර්ධන නිලධාරී	09	08	01
කළමනාකරණ සේවා නිලධාරී	14	13	01
රියදුරු	04	02	02
කාර්යාල සේවක සේවය	06	04	02
එකතුව	**50**	**39**	**11**

1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ❖ විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණ අංශය
- ❖ ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණ සහ ධාරිතා සංවර්ධන අංශය
- ❖ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සම්බන්ධීකරණ අංශය
- ❖ පාලන අංශය
- ❖ ගිණුම් අංශය
- ❖ විශේෂ විමර්ශන අංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 නවීකරණය වූ රාජ්‍ය අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛ දෙපාර්තමේන්තුවක් වන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව අඛණ්ඩව වසර 17 ක් පුරා රාජ්‍ය අංශයේ මූල්‍ය වගවීම තහවුරු කිරීම සඳහා විවිධ වූ ප්‍රගමණ ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. මුදල් රෙගුලාසි 133 අනුව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනත හා 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ මේ වනවිට රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම හා ප්‍රශස්ත පිරිවැයක් යටතේ උපරිම මහජන සේවයක් ලබා දීමට අවශ්‍ය මගපෙන්වීම විගණන හා කළමනාකරණ කමිටු හරහා සිදු කරන අතරම, උපදේශනාත්මක හා අධීක්ෂණ සේවයක් ද ඉටු කරනු ලබයි. එහිදී විවිධ රාජ්‍ය ආයතන මගින් චක්‍රලේඛ, නීති උපදෙස්වලට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කෙරෙන අතර අවශ්‍ය අවස්ථාවලදී උචිත අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

2025 වසරේ අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක, පළාත් සභා, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ව්‍යාපෘති කාර්යාල හා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සලසන රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ/ අභ්‍යන්තර විගණකවරුන්ගේ සහ විගණන කාර්ය මණ්ඩලවල කාර්ය සාධනය සහ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වමින් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ / අභ්‍යන්තර විගණකවරුන්ගේ සහ විගණන කාර්ය මණ්ඩලවල ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පියවර ගෙන ඇත. විශේෂයෙන් රාජ්‍ය අංශයේ විගණන කටයුතු වඩාත් විනිවිදභාවයෙන් සහ කාර්යක්ෂමව ඒකාකාරී අයුරින් සිදු කිරීමට මඟපෙන්වීමේ අරමුණින් අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධ ක්ෂේත්‍ර පුළුල් වශයෙන් ආවරණය කරමින් නිකුත් වූ DMA/01/2025 අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය පිළිබඳ සියලුම ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩ සටහන් සංවිධානය කරන ලදී.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අත්පත් කරගත් වත්කම් ප්‍රමාණවත් ලෙස වාර්තාගත නොකිරීම සහ මාරු කිරීම සම්බන්ධ ගැටලු විසඳීම සහ රාජ්‍ය වත්කම් කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා, 2025.05.27 දින ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය යටතේ වත්කම් මාරු කිරීම පිළිබඳ අතිරේක මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. වත්කම් සත්‍යාපනය කිරීම, ඒවායේ තත්ත්වය ලේඛනගත කිරීම සහ ඒකාකාර සැකිල්ලක් (Uniform Template) භාවිතා කරමින් වගකිවයුතු ආයතනවලට නිල වශයෙන් වත්කම් මාරු කිරීම සඳහා සරල, සම්මත ක්‍රියාවලියක් මෙම මාර්ගෝපදේශය මගින් හඳුන්වා දී ඇත. මහජන අරමුදල්වලින් මිලදී ගත් වත්කම් සඳහා හිමිකාරිත්වය පිළිබඳ නිශ්චිත බව, වඩා හොඳ නඩත්තුව සහ ශක්තිමත් වගවීමක් සහතික කිරීම මෙම මාර්ගෝපදේශය මගින් තහවුරු කිරීම සිදු කරනු ඇත.

ව්‍යාපෘති ප්‍රමාදයන්, ඌන කාර්යසාධනය සහ අසාර්ථකත්වයන් සඳහා එක් ප්‍රධාන හේතුවක් වශයෙන් ව්‍යාපෘති ජීවන චක්‍රයක පවතින සියලුම ප්‍රධාන අදියරයන් ක්‍රමානුකූලව පෙළගස්වන ලද ඒකාබද්ධ අනුකූලතා කාර්ය පටිපාටියක් නොමැති වීමෙන් සිදු වන දුර්වල ව්‍යාපෘති සැලසුම්කරණය, දුර්වල අධීක්ෂණය මෙන්ම ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන පශ්චාත්- පසු විපරම් කිරීම වැනි ගැටලු අවම කිරීමේ අරමුණ ඇතිව ව්‍යාපෘති පිරික්සුම් ලැයිස්තුවක් (Check List) සහ අනුකූලතා රාමුවක් හඳුන්වා දෙන ලදී. මෙම පිරික්සුම් ලැයිස්තුව ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර විගණකවරුන්ගේ දෘෂ්ටි කෝණයෙන් නිර්මාණය කරන ලද අතර , ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, අමාත්‍යාංශ නිලධාරීන් සහ මූල්‍ය අනුග්‍රාහකයන් ඇතුළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශ්වකරුවන්ට ද එමගින් වටිනා මඟපෙන්වීමක් සපයයි. එය ක්‍රියාත්මක කිරීමේ දී විනිවිදභාවය, වගවීම සහ අනුකූලතාව සහතික කරන අතරම අන්තර් ආයතන සම්බන්ධීකරණය ද ශක්තිමත් කරයි.

2025 වර්ෂයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා 17 ක් පැවැත්වීම සඳහා නිර්දේශ වී තිබුණද තත්‍ය ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් 15 ක් පවත්වා ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර වාර්තා යැවිය යුතුව තිබූ සියලුම වාර්තා මහා භාණ්ඩාගාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදෙනු ලබන දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් යවා ඇති අතර පැවැත්වූ කාරක සභා 15 සඳහාම දෙපාර්තමේන්තු නිලධාරීන් සක්‍රීයව සහභාගී වී ඇත.

විවිධ ආයතනවල සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධව පැමිණිලි 72 ක්, 2025 වර්ෂය තුල දී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. එම පැමිණිලිවල සඳහන් කරුණු සලකා බලා ඇතැම් පැමිණිලි සම්බන්ධව විමර්ශන සිදු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, ඇතැම් පැමිණිලි සම්බන්ධ විමර්ශන මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරහා සිදු කිරීමට කටයුතු කර ඇති අතර ඇතැම් පැමිණිලි අදාළ ආයතනවල /අමාත්‍යාංශවල අභ්‍යන්තර විගණන අංශ වෙත යොමු කර විමර්ශන වාර්තා කැඳවීමට කටයුතු කර ඇත. එම විමර්ශන වාර්තාවලට අනුව, මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශ ද ඇතුලත් කර අදාළ ආයතන/අමාත්‍යාංශ වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

2025 වර්ෂය තුල දී විමර්ශන 19 ක කටයුතු අවසන් කර ඇති අතර, ඒ තුළ 2023 සහ 2024 වර්ෂවල දී ලද පැමිණිලිවලට අදාළ විමර්ශන ද ඇතුළත් වේ. එමෙන්ම, 2025 වර්ෂයේ ලද පැමිණිලි 14 ක් සම්බන්ධව විමර්ශන වාර්තා ලබා ගැනීමට හා තොරතුරු කැඳවීමට කටයුතු කර ඇති අතර එම විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරමින් පවති. තව ද , 2025 වර්ෂයට පෙර වර්ෂවල දී ලැබී ඇති නමුත් විමර්ශන කටයුතු අවසන් නොවූ පැමිණිලි 17 ක් පිළිබඳව විමර්ශන කටයුතු ද 2025 වර්ෂය තුළ ද තවදුරටත් සිදු කරමින් පවති.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය අනුව එම පනතේ 41 (2) උප වගන්තිය යටතේ සඳහන් සියලුම ආයතනවල අභ්‍යන්තර විගණන වාර්තා මෙම දෙපාර්තමේන්තුවට ලබාගෙන තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු විගණන වාර්තා සම්බන්ධව දෙපාර්තමේන්තු නිලධාරින් මගින් අදාළ විගණන හා කළමනාකරණ කමිටු වලදි අවශ්‍ය මඟපෙන්වීම් ලබා දීමට කටයුතු කර ඇත.

2025 වර්ෂය තුළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ සමාලෝචන රැස්වීම් 16ක් පැවැත්වූ අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබා දෙන රාජ්‍ය ව්‍යවසායන් සඳහා සමාලෝචන රැස්වීම් 5ක් පවත්වා එමඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන්හි ඵලදායීතාවය, අභ්‍යන්තර පාලන පද්ධතිවල ක්‍රියාකාරීත්වය සහ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳ සාකච්ඡාවට ලක් කරන ලදී. එහිදි හඳුනාගත් අඩු ලුහුඬුතා, පාලන දුර්වලතා සහ ක්‍රියාත්මක කිරීමේ හිඟතා පිළිබඳව සවිස්තරාත්මක වාර්තා සකස් කර ඒ ඒ ආයතනවල අභ්‍යන්තර විගණකවරුන් වෙත යොමු කර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් හා නිර්දේශ ලබා දෙන ලදී. මෙම ක්‍රියාමාර්ග මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ශක්තිමත් කර, ආයතනික කාර්යක්ෂමතාව, පාරදෘශ්‍යතාව සහ වගකීම්භාවය ඉහළ නැංවීමට දායකත්වය සපයන ලදී.

පෞද්ගලික අංශයේ ප්‍රමුඛ විගණන ආයතනයක් වන Earnst & Young ආයතනය සමඟ එක්ව අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු මොඩියුලයක් සකස් කර ඇති අතර රාජ්‍ය අංශයට නව සංකල්පයක් වන අවදානම් කළමනාකරණය රාජ්‍ය අංශය වෙත හඳුන්වාදීම සඳහා පෞද්ගලික අංශයේ සාර්ථක අත්දැකීම් උපයෝගී කර ගැනීමට මේතුළින් අවස්ථාව සැළසේ.

අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයේ වෘත්තීය දැනුම, නව තාක්ෂණික සොයා ගැනීම් හා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අභ්‍යන්තර විගණකවරුන් සහ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් අතර සංනිවේදනය කිරීම අරමුණු කරගෙන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සඳහා නිල YouTube චැනලය හඳුන්වා දෙන ලදී.

2.2 අනාගත ඉලක්ක

2.2.1 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තියට අදාළව රෙගුලාසි පිළියෙළ කිරීම අවසන් අදියරේ පවතින අතර මෙම කටයුත්ත 2026 වර්ෂය තුල අවසන් කර අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය.

2.2.2 ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ හා අභ්‍යන්තර විගණකවරුන්ගේ දැනුම, කුසලතා තවදුරටත් වර්ධනය කිරීම සඳහා සහ අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දැනුම සහ හැකියාව වැඩිදියුණු කිරීම තුළින් අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීම අරමුණු කරගත් නිරන්තර පුහුණු වැඩසටහන් මධ්‍යගතව හා පළාත් සභා මට්ටමෙන් පවත්වා ශක්තිමත් හා ගුණාත්මක කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

2.2.3 DMA 01/2024 අවදානම් කළමනාකරණ රාමුව චක්‍රලේඛයට අනුව රජයේ ආයතන වල අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කර ක්‍රියාත්මක කළ හැකි වන පරිදි එම ආයතන වල අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයන් සම්බන්ධ කරගනිමින් පුහුණු වැඩසටහන් 2026 වර්ෂය පුරා පැවැත්වීමටත් එම අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය හා අවශ්‍ය සහාය ලබාදීමටත් සැලසුම් කර ඇත.

2.2.4 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තියට අදාළව පිළියෙළ කර ඇති රෙගුලාසි පදනම් කර ගෙන ඊට අනුරූපිත නියෝග සහ ක්‍රියාත්මක කිරීමේ උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.5 2018 අංක 16 දරණ ජාතික විගණන පණතේ 40(4) උපවගන්තිය අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අභ්‍යන්තර විගණන වාර්තා වල මෘදු පිටපත්, විගණන හා කළමනාකරණ කමිටු වාර්තා, කාර්තුමය ඇගයීම් වාර්තා හා අනෙකුත් ලිපිලේඛන ජාලගත පද්ධතියක් හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමටත් අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා පහසුකම් සැපයෙන පරිදි DMA Connect මෘදුකාංගයේ දෙවන අදියර සංවර්ධනය කිරීමට නියමිතය.

2.2.6 විවිධ ආයතනවල සිදුවිය හැකි අක්‍රමිකතා හා අකාර්යක්ෂමතා අවම කරමින්, පද්ධතිගත හා ප්‍රතිඵලදායී විමර්ශන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම මගින් ආයතනික කාර්යක්ෂමතාව, පාරදෘශ්‍යතාව හා වගකීම්භාවය තවදුරටත් ඉහළ නැංවීම.

2.2.7 දෙපාර්තමේන්තුවේ නිල YouTube චැනලය ඔස්සේ 2026 වර්ෂය තුල පහත වැඩසටහන් ප්‍රචාරණය කිරීමට සැලසුම් කර ඇත.

- අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩසටහන්
- නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීම
- වෘත්තීය සංවර්ධන වැඩසටහන්ව
- විශේෂ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ

දෙපාර්තමේන්තු ප්‍රධානි

2026.06.

3.1

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තතය 2025 රු.	2024 රු.	
	ආදායම් ලැබීම්		-	-	
	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		65,455,148	63,446,000	ඒසීඒ-3
	තැන්පතු		2,347,875	370,387	ඒසීඒ-4
	අත්තිකාරම් ගිණුම්		4,854,958	3,519,926	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**72,657,981**	**67,336,313**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**72,657,981**	**67,336,313**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	118	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		72,657,981	67,336,195	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	ඒසීඒ-2(ii)
52,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	49,399,427	45,793,752	ඒසීඒ-2(ii)
19,495,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	13,802,464	16,553,309	ඒසීඒ-2(ii)
900,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	481,808	669,017	ඒසීඒ-2(ii)
	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
72,395,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**63,683,699**	**63,016,078**	
	මූලධන වියදම්				
1,950,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	1,377,445	1,064,444	ඒසීඒ-2(ii)
2,405,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,105,577	975,860	ඒසීඒ-2(ii)
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
16,952,000	හැකියා වර්ධනය	14	2,411,390	1,062,775	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
21,307,000	**මුළු මූලධන වියදම් (උ)**		**5,894,412**	**3,103,079**	
	තැන්පතු ගෙවීම්		2,347,875	370,387	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,543,356	3,562,934	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		6,891,231	3,933,321	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		76,469,342	70,052,478	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(3,811,361)**	**(2,716,283)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(3,811,361)	(2,716,283)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(3,811,361)	**(2,716,283)**	

3.2

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	සත්‍ය 2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	33,875,938	31,989,231
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	6,244,619	6,556,221
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**40,120,557**	**38,545,452**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		6,244,619	6,556,221
දේපළ පිරියත හා උපකරණ සංචිතය		33,875,938	31,989,231
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**40,120,557**	**38,545,452**

පිටු අංක 07 සිට 22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 23 සිට 28 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්වලින් අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය **ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 01/2025 ප්‍රතිපාදනයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුම්වල සඳහන් සංඛ්‍යා, එට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වගකීන් වන සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
තනතුර : ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
දිනය : 2026.02.
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

ගණන්දීමේ නිලධාරී
නම : ඒ.සී. කුරුම්බලපිටිය
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2026.02. 19
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ගණකාධිකාරී
නම : පී. ප්‍රභාහරන්
තනතුර : නි. අධ්‍යක්ෂ
දිනය : 2026.02. 19
පී. ප්‍රභාහරන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.3

ඒසීඒ-සි

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,790,173	2.338.508
අග්‍රිම ලැබීම්	65,455,148	63.446.000
අත්තිකාරම් අයකර ගැනීම්	4,188,688	3.161.809
තැන්පතු ලැබීම්	2,347,875	370.387
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**74,781,884**	**69,316,704**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	62,898,641	62.053.311
සහනාධාර සහ මාරුකිරීම්	481,808	669.017
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	2,206,475	1.362.560
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	198,152	322.517
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	118
අත්තිකාරම් ගෙවීම්	4,543,356	3.562.934
තැන්පතු ගෙවීම්	2,347,875	370.387
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**72,676,307**	**68,340,844**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,105,577**	**975,860**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	2,105,577	975.860
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,105,577**	**975,860**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,105,577)**	**(975,860)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	**(0)**	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
	අදාල නොවේ.				

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන ,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	72,500	72,395	63,684	88 %
ප්‍රාග්ධන	6,250	21,307	5,894	28 %

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	අදාල නොවේ.					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	0	0	0	0
9152	යන්ත්‍රෝපකරණ	33,876	33,876	0	100%
9153	ඉඩම්	0	0	0	0
9154	අස්පෘශ්‍ය වත්කම්	0	0	0	0
9155	ජීව විද්‍යාත්මක වත්කම්	0	0	0	0
9160	කෙරීගෙන යන වැඩ	0	0	0	0
9180	බදු දෙන ලද වත්කම්	0	0	0	0

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TPD/C/25/34/DMA/FA

ඔබේ අංකය
உமது இல.
Your No.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
31627 - DD - Finance
29 MAY 2026
Department of Management Audit
General Treasury

දිනය
திகதி
Date 2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුව) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්,මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුව, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

3.1.1 අපේක්ෂිත වියදම තාත්විකව හඳුනා නොගෙන තත්කාර්ය අතුරු අග්‍රිමයේ වටිනාකම තීරණය කිරීම හේතුවෙන් කාර්යය නිම වීමෙන් පසුව, අවස්ථා දෙකකදී ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 48ක් සහ සියයට 71ක්, එනම් පිළිවෙලින් රු.27,000 ක් සහ රු.18,870 ක් ආපසු මුදලින් පියවීම කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.1.2 සුළු මුදල් හා තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛනයේ අතුරු අග්‍රිම නිකුත් කරන නිලධාරියාගේ නම හා තනතුර සඳහන් කර නොතිබීමත්, අතුරු අග්‍රිම නිකුත් කරනු ලබන්නේ කුමන කාර්යයන් සඳහාද යන්න පිළිබඳ කෙටියෙන් විස්තරයක් සඳහන් නොකිරීමත් හා පියවීම් වවුචර් අංකය සඳහන් කර නොතිබීමත් හේතුවෙන් එම ලේඛනය අසම්පූර්ණ ලෙස පිළියෙල කර තිබුණි.

3.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 (i) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ රියදුරන් දෙදෙනෙකු විසින් රජයේ ඇප ආඥා පනතට අනුව ඇප තැබීම සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) 2025 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ අක්‍රමිකතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 72 ක් වන අතර, 2025 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කර ඇති පැමිණිලි ගණන 19 ක් පමණක් බව නිරීක්ෂණය වේ. ඒ අතරින් පැමිණිලි 18 ක් 2023 සහ 2024 වර්ෂවලට අදාළ පැමිණිලි වන අතර, 2025 ට අදාළව එක් පැමිණිල්ලක් පමණක් විමර්ශනය කර තිබුණි.

(ආ) රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි සංවිධානය කර දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමෙන් පසු භාණ්ඩාගාරය නියෝජනය කරමින් නිලධාරින් එම රැස්වීම් සඳහා යොමු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයකි. විගණනයට ලද තොරතුරු අනුව 2025 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 492 ක් පවත්වා ඇති අතර, ඉන් රැස්වීම් 467 කට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරින් සහභාගී වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 50ක් වූ අතර, ඉන් තනතුරු 11 ක් පුරප්පාඩු ලෙස පැවති බවත් ඉන් 05ක් එනම් සියයට 45 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු බවත් නිරීක්ෂණය විය.

එස්.රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම		
		90%- 100%	75%-89%	50%- 74%
01	**අභ්‍යන්තර විගණන කටයුතු තුළින් විගණන හා කළමනාකරණ කමිටු (AMC) සුමටව ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම සහතික කිරීම**	100%		
02	**පළාත් පාලන ආයතනවල සහ පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම** 01. පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධව දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම 02. පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකක මගින් විගණන වාර්තා ලබා ගැනීම 03.කාර්තු වාර්තා සකස්කිරීම	100%	85% 85%	
03	**රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයන්හි (SOE s) අභ්‍යන්තර විගණන ඒකක සමාලෝචනය** රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයන්හි අභ්‍යන්තර විගණකවරුන් සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	100%		
04	**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා (COPA) ක්‍රියාකාරකම් තුළින් රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම**	100%		

05	**අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම**		89%	
06	**මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සංවර්ධනය කිරීම** අංක DMA/01/2025 අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය නිකුත් කිරීම.	100%		
07	**අමාත්‍යාංශ යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීම** I. සංවර්ධන ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම හා ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ පිරික්සුම් ලැයිස්තු නිකුත් කිරීම. II. ව්‍යාපෘති විගණන හා කළමනාකරණ කමිටු සඳහා සහභාගී වීම.	90%		
08	**විවිධ රාජ්‍ය ආයතනවලට අදාළව දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි පිළිබඳ විමර්ශන කටයුතු**			38%

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

5.1 අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම

අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක	අරමුණු	සාර්ථකත්වයේ දර්ශක	සාර්ථකත්වය ළඟා කර ගැනීමේ ප්‍රගතිය (%)		
			0-49	50-74	75- 100
ඉලක්කය-09 ශක්තිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.	තිරසාර යටිතල පහසුකම් සහ කාර්මීකරණයේ සමස්ත ඉලක්කයට දායක වන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුළ සම්පත් කාර්යක්ෂම කළමනාකරණය සහ භාවිතය සහතික කිරීම.	යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති වලින් කොපමණ ප්‍රතිශතයක් අවදානම් පාදක විගණන වාර්තා වලින් ආවරණය වන්නේද සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීම			95%
ඉලක්කය-16 තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ ඇතුළත් සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වල ඵලදායී, වගවීමේ සහ පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම.	විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ දායක වීම සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම මඟින් විනිවිදභාවය, වගවීම සහ යහපාලනය සහිත ශක්තිමත් ආයතන ගොඩනැගීමට දායක වීම.	පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් ගණන, 2025 වර්ෂය තුළ පැවැත්විය යුතුව තිබූ මුළු කමිටු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (467/492)			95%

ඉලක්කය-17 ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම, තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පුනර්ජීවනය කිරීම.	තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සහයෝගීතාවය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් කොටස්කරුවන් අතර සහයෝගීතාවය සහ දැනුම බෙදාගැනීම මඟින් වර්ධනය කිරීම.	පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන, සැලසුම් කළ වැඩසටහන් ගණනට දක්වන ප්‍රතිශතය.			89%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 ජයග්‍රහණ

2025 වර්ෂය තුලදි අමාත්‍යාංශ 25 ක දෙපාර්තමේන්තු 46 ක පළාත් සභා 9ක, විශේෂ වියදම් ඒකක 13 ක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක කාර්තු 04 සඳහා පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහභාගී වී ඇත.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ විශේෂ වියදම් ඒකකයන්හි පැවත්වීමට නියමිත වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රමාණය 472 ක් වන අතර අමාත්‍යාංශ යටතේ ඇති අනෙකුත් ඒකක වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් කමිටු රැස්වීම් 64ක් පැවැත්වීමට නියමිතව තිබුණි. ඉහත ආයතන වල 2025 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 492 ක් පවත්වා ඇති අතර එයින් රැස්වීම් 467 ක් සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු නියෝජිතයින් සහභාගීවී ඇත. එම ආයතන වල මූල්‍ය, මානව සම්පත් හා භෞතික සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් හා මඟපෙන්වීම් සිදුකරමින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෘජුව හා වක්‍රව දායකත්වය ලබාදී ඇත.

2025 වර්ෂයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා 17 ක් පැවැත්වීම සඳහා නිර්දේශ වී තිබුණද තත්‍ය ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් 15 ක් පවත්වා ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර වාර්තා යැවිය යුතුව තිබූ සියළුම වාර්තා මහා භාණ්ඩාගාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදෙනු ලබන දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කරමින් යවා ඇති අතර පැවැත්වූ කාරක සභා 15 සඳහාම දෙපාර්තමේන්තුව සක්‍රීයව සහභාගී වී ඇත.

කළමනාකරණ විගණන චක්‍රලේඛය අංක **DMA/01/2025** අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය 2025.04.28 දින නිකුත් කරන ලදී. 2019.01.12 දිනැති අංක **DMA/01-2019** දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය, 2020.08.26 දිනැති පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 1 සහ ඊට පසුව එම චක්‍රලේඛ වලට සිදු කරන ලද සංශෝධන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන නිකුත් කළ විවිධ මාර්ගෝපදේශ සියල්ල සැලකිල්ලට ගෙන මෙම නව චක්‍රලේඛය නිකුත් කරනු ලදී. මෙහිදි, ඉහත චක්‍රලේඛ හා මාර්ගෝපදේශවල ඇතුලත් ඇතැම් කරුණු සංශෝධනය කර ඇති අතර ඊට අමතරව විගණන හා කළමනාකරණ කමිටු වලදී නිරීක්ෂණය වූ අවදානය යොමු කළ යුතු නව ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන මඟපෙන්වීම්ද ඇතුළත් කර ඇත.

දිවයිනේ සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්, අභ්‍යන්තර විගණකවරුන් හා අභ්‍යන්තර විගණන කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම තුලින් කාර්යක්ෂම සේවයක් තම ආයතන වලට ලබා දීමට දායක වී ඇත. 2025 වර්ෂය තුල මෙම පුහුණු වැඩසටහන් 13 ක් පවත්වා ඇත.

2025 වර්ෂය තුළ අභ්‍යන්තර විගණකවරුන්ගේ ධාරිතා සංවර්ධනය හා නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ පිළිබඳව දැනුම පුළුල් කිරීම අරමුණු කරගත්, පුහුණු වැඩසටහන් 04ක්, මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදි. එමෙන්ම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින්, අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන ලබාදුන් මුදල් ප්‍රදානය මඟින් පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් අභ්‍යන්තර විගණකවරුන් හා පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ අභ්‍යන්තර විගණන අංශවලට අනුයුක්ත නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය අරමුණු කරගත් එක් දින පුහුණු වැඩසටහන් 03 ක් සහ දෙදින පුහුණු වැඩසටහන් 06 ක් (මුළු වැඩසටහන් 09ක්) පැවැත්වීමට කටයුතු කරන ලදි. එමඟින් පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමේ අවම අවස්ථාවන් සහිත නිලධාරින්ට ඔවුන්ට ආසන්නම නගරයේ දී, අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ඉතා වැදගත් තේමාවන් ඔස්සේ (කාර්ය සාධන විගණනය, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අවධානය යොමු කළ යුතු තාක්ෂණික කරුණු, ඉඩම් පරිපාලනය හා කළමනාකරණය) පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී. 2025 වර්ෂය තුල නිලධාරීන් 1301 දෙනෙකු හට පුහුණු අවස්ථා ලබා දී ඇති අතර ඒ ඔස්සේ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනයට, දැනුම හා ආකල්ප සංවර්ධනයට පවතින තාක්ෂණික ගැටළු සඳහා විසඳුම් ලබාදීමට, අමතරව සේවා අභිප්‍රේරණය හා තෘප්තිමත්භාවය ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලැබී ඇත.

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන්ගේ රාජකාරි කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කිරීම මඟින් ඔවුන්ට පවතින ගැටලු මඟ හැර ගෙන කාර්යක්ෂම සේවයක් සැපයීමට සහ කාර්ය සාධනය ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගැනීම අරමුණු කරගනිමින් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ව්‍යවසායන් වල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් කැඳවා ඒ ඒ ආයතන සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 21 ක් පහත පරිදි පවත්වන ලදි.

- අමාත්‍යාංශ 09
- දෙපාර්තමේන්තු 07
- රාජ්‍ය ව්‍යවසායන් 05

2025 වසර තුළ, සංවර්ධන ව්‍යාපෘතිවල පාලනය, මූල්‍ය විනය සහ අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ව්‍යාපෘති 44 ක් සඳහා පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු (AMC) රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී විය. මෙම මැදිහත්වීම තුළින්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, අභ්‍යන්තර පාලන ගැටලු සහ අනුකූලතා කරුණු සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවන් හිදී මඟපෙන්වීම හා නිර්දේශ ලබාදීම සිදු කරන ලදී.

විවිධ ආයතනවල සිදුවන අක්‍රමිකතා පිළිබඳව ලද පැමිණිලි විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද නිසි පරිදි ක්‍රියාත්මකව නොමැති අවස්ථා සඳහා සුදුසු ක්‍රමවේද නිර්දේශ කිරීම මගින් විවිධ ආයතනවල සිදු විය හැකි අක්‍රමිකතා අවම කර ඵලදායිතාවය ඉහළ නැංවීමට දායකත්වය ලබා දීමට කටයුතු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ පොදු මහජනතාව සහ සම්බන්ධිත පාර්ශව දැනුවත් කිරීම සඳහාත් අවම පිරිවැයක් යටතේ පුළුල් ආවරණයක් සහිතව අභ්‍යන්තර විගණන අංශවල නිලධාරීන් සඳහා දැනුම බෙදා හැරීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු නිල You tube නාලිකාවක් 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට හැකිවුණි.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ විශේෂ වියදම් ඒකක වල ප්‍රධාන අභ්‍යන්තර විගණක/ අභ්‍යන්තර විගණක විසින් පිළියෙල කරනු ලබන අභ්‍යන්තර විගණන සැලැස්ම පරිගණකගත මෘදුකාංගයක් හරහා පිළියෙල කිරීම සහ ඒ සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබාගැනීමේ පහසුකම සහිත DMA CONNECT මෘදුකාංගයේ පළමු අදියර සාර්ථකව අවසන් කිරීමට හැකිවිය.

5.2.2 අභියෝග

රජයේ වියදම් අරපිරිමැස්මෙන් යුතුව සිදුකළ යුතු වීම හේතුවෙන් පිට පළාත් වල පවත්වන සෑම විගණන හා කළමනාකරණ කමිටුවක් සඳහාම භෞතිකව සහභාගී වීමට නොහැකිවීම හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් ඇතුලු නිලධාරීන් අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීමට තම කාර්යයන් කෙසේ බලපායිද යන්න පිළිබඳව ඇති අවබෝධය අඩු වීමද තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යන ගමනට අභියෝගයක් වේ. සියලුම රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටුවලට සහභාගී වීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව සතුව නොසිටීම මෙන්ම පුහුණු සහාය කාර්යමණ්ඩලයක් නොමැති වීමද තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වීමට බාධා ඇති කරයි.

එමෙන්ම අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීමේදී ඒ සඳහා පරිචයක් ඇති දේශකවරුන් පවත්නා ගාස්තු ක්‍රමවේදය යටතේ සේවයේ යොදවා ගැනීම ප්‍රායෝගික නොවන අතර එය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය කෙරේ අහිතකර බලපෑමක් ඇති කර තිබේ. එමෙන්ම පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමද දෙපාර්තමේන්තුව මුහුණ දෙන එක් අභියෝගයකි.

පරිච්ඡේදය 06 - අවදානම් කළමනාකරණ රාමුව

දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාව තුල අවදානම් කළමනාකරණ රාමුව

6.1 පාලනය සහ උපාය මාර්ගික පෙළගැස්ම

අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ පළාත් සභා වල ඵලදායී අධීක්ෂණය තහවුරු කරමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව එහි මූලික කාර්යයන් වලට අවදානම් කළමනාකරණ රාමුවක් සකස් කර ක්‍රියාත්මක කර ඇත. මෙම රාමුව ජාතික පාලන ප්‍රතිපත්ති සමග සමපාත වන අතර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු වලට විශේෂිත වූ අවදානම් හඳුනා ගැනීම, ඒවා ඇගයීම සහ ඒවායේ බලපෑම අඩු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහගත මගපෙන්වීම සපයයි.

6.2 දෙපාර්තමේන්තු අවදානම් සංස්කෘතිය සහ අවදානම් අභිරුචිය

6.2.1 අවදානම පිළිබඳ දැනුවත් සංස්කෘතියක් ස්ථාපිත කිරීම

- දෛනික කටයුතු වලදී සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඇතිවිය හැකි අවදානම ඇතුලත් කරමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරි අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ඇත.
- අවදානම් කළමනාකරණ මූලධර්ම, අභ්‍යන්තර විගණන ක්‍රියාවලි, පුහුණු වැඩසටහන් සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට අන්තර්ගත කර ඇත.
- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සම්බන්ධ මුලපිරීම්, දෙපාර්තමේන්තු පාලන කටයුතු තුල අවදානම් කළමනාකරණය ඉතා වැදගත් අංගයක් බව තහවුරුකර ඇත.

6.2.2 අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම

- විවිධ මෙහෙයුම් කටයුතු සඳහා වූ පිලිගත හැකි අවදානම් මට්ටම් හඳුන්වා දෙන අවදානම් අභිරුචි ප්‍රකාශයක් දෙපාර්තමේන්තුව මගින් නිර්වචනය කර ඇත.
- අවදානම් භාර ගැනීම සහ එහි බලපෑම අඩු කිරීම සඳහා සමබර ප්‍රවේශයක් තහවුරු කරමින් අවදානම් අභිරුචිය පහළ, මධ්‍යම හා ඉහළ දරාගැනීමේ මට්ටම් ලෙස වර්ග කරනු ලැබේ.
- රජයේ පුමුඛතාවන් සහ පරිනාමය වන අවදානම් පරිසර අනුව අවදානම් අභිරුචි මට්ටම් කාලානුරූපීව සමාලෝචනය කරනු ලැබේ.

6.3 අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම

6.3.1 දෙපාර්තමේන්තුවේ කාර්යන් සඳහා යොදා ගැනීම.

- වඩා ගැලපෙන අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරන සහ හඳුනාගත් අවදානම් පිළිබඳව සාකච්ඡා කරන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට මෙම රාමුව ඒකාබද්ධ කර ඇත.
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලීවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්ට ලබා දී ඇති මඟපෙන්වීමෙහි අවදානම් ඇගයීමේ ක්‍රමවේද අන්තර් ගත කර ඇත.
- අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුල ඇති මූල්‍ය සහ මෙහෙයුම් පාලන ක්‍රම ඇගයුම සඳහා මෙම රාමුව උපකාරි වේ.

6.3.2 මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු මොඩියුලයක් සකස් කර ඇත.

6.4 අභ්‍යන්තර විගණනය සහ පාලන යාන්ත්‍රණය ඒකාබද්ධ කිරීම

6.4.1 අවදානම් පාදක අභ්‍යන්තර විගණන

- අවදානම් පාදක ඇගයීම් තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් විසින් සිය අභ්‍යන්තර විගණන සැළසුම් සහ වාර්තා, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ජාලගත අභ්‍යන්තර විගණන කළමනාකරණ පද්ධතිය වෙත යොමු කළ යුතුය.
- දෙපාර්තමේන්තු මූල්‍ය ගනුදෙනු සහ අනුකූලතා ඇගයීම් වල පවතින ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගැනීමේදී මෙම රාමුව ඉවහල් වී ඇත.

6.4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ඒ ඒ දෙපාර්තමේන්තුවලට අදාල ප්‍රතිපාදන වෙන් කිරීම්, විගණන ඵලදායීතාව සහ පාලන කටයුතුවලට අදාල ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ සාකච්ඡා කිරීම සිදු කෙරේ.
- දෙපාර්තමේන්තුවේ ඩිජිටල් විගණන වේදිකාව හරහා යොමු කර ඇති අවදානම් ඇගයීමේ වාර්තා පදනම් කරගෙන අමාත්‍යාංශ සඳහා ක්‍රියාවට නැංවිය හැකි නිර්දේශ ලබා දෙනු ලැබේ.

6.5 හඳුනාගත් ප්‍රධාන අවදානම් සහ ඒවා අවම කිරීමේ උපාය මාර්ග

6.5.1 දෙපාර්තමේන්තු කාර්යයන්ට අදාල ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර

- **මෙහෙයුම් අවදානම්**
  - විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණ අකාර්යක්ෂමතා, විගණන මාර්ගෝපදේශ නිකුත් කිරීමේ ප්‍රමාදයන් සහ පුහුණු වැඩසටහන් සඳහා පවතින සම්පත් වල සීමාවන්.
- **අනුකූලතා සහ නීතිමය අවදානම**
  - විගණන වාර්තා කිරීමේ කාලසීමාවන්ට අනුකූල නොවීම , විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් ප්‍රමාණවත් නොවීම, අවදානම් වාර්තාකරණයේ නොගැලපීම්
- **උපාය මාර්ගික අවදානම**
  - දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ මූලපිරීම් වඩාත් පුළුල් ජාතික ප්‍රතිපත්ති සමග පෙළගැස්වීමේ අභියෝග
- **කීර්ති නාමය පිළිබඳ අවදානම**
  - විගණන විමසුම් සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම හේතුවෙන් පැන නගින අවදානම හා වගවීම ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමෙන් පැනනගින අවධානම්
- **දේශපාලනික/ භූ දේශපාලනික අවදානම්**
  - දෙපාර්තමේන්තුවේ විගණන අධීක්ෂණ ක්‍රියාවලීන් ඵලදායීව ක්‍රියාවට නැංවීමේ හැකියාවට බලපාන බාහිර පීඩන.

6.5.2 අවදානම් අවම කිරීමේ උපාය මාර්ග

- විගණන නිර්දේශ සම්බන්ධයෙන් කලට වේලාවට පසු විපරම් කරන බවට තහවුරු කර ගැනීම සඳහා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක්.

- විගණන ප්‍රගතිය තත්‍ය කාලීනව ලබා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කළමනාකරණ පද්ධතිය තුළින් වැඩිදියුණු කළ අවදානම් වාර්තාකරණ ව්‍යුහයක්.

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, අභ්‍යන්තර විගණන පුහුණු සහ අවදානම් පාදක මූල්‍ය අධීක්ෂණය සඳහා විශේෂයෙන් ගොඩනංවනලද අවදානම් අභිරුචි ප්‍රකාශයක්.

- අවදානම් ක්ෂේත්‍ර වල බලපෑම අඩු කිරීම සහ පාලන ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට ස්ථාපිත කරන ලද හඳුනාගැනීමේ, වැළැක්වීමේ හා නිවැරදි කිරීමේ පාලන ක්‍රමවේද.

6.6 කාර්ය සාධන ඇගයීම සහ බලපෑම

6.6.1 දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයට දායකවීම

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය වැඩියුණු කිරීම තුළින් අවදානම් අවම කිරීමේ ක්‍රියාවන් ක්‍රමානුකූලව හඳුනාගැනීම.
- අභ්‍යන්තර විගණන වාර්තාකරණ අවශ්‍යතාවයන් සඳහා අනුකූල වීම ඩිජිටල් වේදිකාවක් තුළින් වැඩිදියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව තුල අවදානම් හා බැඳුණු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ විනිවිද භාවය ඉහළ නැංවීම.

6.6.2 ජයග්‍රහණ

- වෙබ් පාදක අභ්‍යන්තර විගණන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මගින් අවදානම් පාදක විගණන ඉදිරිපත් කිරීම සහ දත්ත නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම විධිමත් කර ඇත.
- දෙපාර්තමේන්තු මූල්‍ය කළමනාකරණ පද්ධතියට යොදාගන්නා ලද අවදානම අවම කිරීමේ උපාය මාර්ග, එහි පාලන නිමැවුම් වැඩිදියුණු කිරීමට බලපා ඇත.

6.7 අභියෝග හා අනාගත වැඩිදියුණු කිරීම්

6.7.1 ක්‍රියාත්මක කිරීමේ අභියෝග

- අවදානම් කළමනාකරණ මෙවලම් ඵලදායීව යෙදවීමට දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ හා අභ්‍යන්තර විගණක වරුන්ගේ ධාරිතාවය තවදුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය.
- තත්‍යකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවදානම් දත්ත ඒකාබද්ධ කිරීම සීමාසහිත වීම.

6.7.2 ඉදිරි වැඩිදියුණු කිරීම්

- අවදානම් වාර්තාකරණ ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ජාලගත අවදානම් කළමනාකරණ පද්ධතිය පුළුල් කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, විගණන ඵලදායීතාව හා මූල්‍ය පාලන කටයුතු පිලිබඳ අවදානම් අධීක්ෂණය සඳහා අන්තර් ක්‍රියාකාරී අවදානම් මෙවලම් පුවරුවක් සංවර්ධනය කිරීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අලුතින් පැනනගින අවදානම්ද අන්තර්ගත කිරීම සඳහා අවදානම් රාමුවට අවශ්‍ය නිරන්තර යාවත්කාලීන කිරීම් සිදුකිරීම

6.8 නිගමනය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට, විශේෂයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම සහ මූල්‍ය අධීක්ෂණ කටයුතු වලට අදාල අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ රාමුව ඉවහල් වී ඇත. ඩිජිටල් මෙවලම්, පුහුණුව සහ ප්‍රතිපත්ති සංවර්ධනය තුල අඛණ්ඩ වැඩිදියුණු කිරීම්, රාජ්‍ය අංශයේ පාලනයට සහාය වන තිරසාර අවදානම් කළමනාකරණ පිලිවෙත් සහතික කරනු ඇත.

පරිච්ඡේදය 07 -උපායමාර්ගික සැලැස්ම (2026-2030)

1. විධායක සාරාංශය

මෙම 2026–2030 උපායමාර්ගික සැලැස්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණන කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යුහගත මාර්ග සිතියමක් සපයයි. ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ ගෝලීය පිළිගත් භාවිතයන් සමඟ විගණන අධීක්ෂණය සමඟ පෙළගැස්වීම මෙහි අරමුණයි. පාලනය ශක්තිමත් කිරීම, ඩිජිටල්කරණය, ධාරිතා වර්ධනය, විගණන සහ කළමනාකරණ කමිටු වල සඵලදායීතාවය සහ උපායමාර්ගික පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය යන ප්‍රධාන කරුණු අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර අතර වේ. වගවීම සහ මැනිය හැකි බලපෑම සහතික කිරීම සඳහා කාර්ය සාධන දර්ශක, අවදානම් අවම කිරීමේ පියවර සහ ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව මෙම සැලැස්මට ඇතුළත් වේ.

2. හැඳින්වීම

2.1 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ පසුබිම

මෙරට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රාමුව තුළ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වැදගත් අධීක්ෂණ ආයතනයක් ලෙස කටයුතු කරයි. මූල්‍ය රෙගුලාසි 133 සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, ඵලදායිතාවය සහ ආර්ථිකමයභාවය තක්සේරු කිරීම මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. එහි මූලික වගකීම වන්නේ රජයේ ආයතන යහපත් මූල්‍ය කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරන බව සහතික කිරීමයි. මුදලේ වටිනාකම, විනිවිදභාවය සහ වගවීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ පාලනය ශක්තිමත් කිරීමට සහ රට පුරා සේවා සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් සිදු කරයි.

2.2 දෙපාර්තමේන්තුවේ නීතිමය අධිකාරිය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් මෙහෙයවනු ලබන්නේ:

- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (33 වගන්තිය)
- 2018 අංක 19 දරන ජාතික විගණන පනත (40 සහ 41 වගන්තිය)
- භාණ්ඩාගාර නියෝග

2.3 රාජ්‍ය අංශයේ විගණන අධීක්ෂණයේ ප්‍රතිසංස්කරණවල වැදගත්කම

ඉස්මතුවෙමින් පවතින පාලන අභියෝගවලට මුහුණ දීම සඳහා විගණන කාර්යයන් අදාළ වන අයුරින් ප්‍රතිචාරාත්මක සහ ඵලදායී ලෙස පවතින බව සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ විගණන අධීක්ෂණයේ ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය ආයතන විසින් මුහුණ දෙන ඉහළයන සංකීර්ණතාවය, තාක්ෂණික වෙනස්කම් සහ ඉහළ යන මහජන අපේක්ෂාවන්ට සුදුසු වන පරිදි, කාලෝචිත, අවදානම් මත පදනම් වූ සහ ප්‍රතිඵල මත පදනම් වූ අධීක්ෂණයක් සැපයීම සඳහා විගණන පද්ධති පරිණාමය විය යුතුය. ප්‍රතිසංස්කරණ හරහා විගණන අධීක්ෂණය ශක්තිමත් කිරීම තුළින් විනිවිදභාවය, වගවීම සහ මූල්‍ය විනය වැඩි දියුණු කරන අතරම රජයේ මෙහෙයුම් කෙරෙහි මහජන විශ්වාසය සහ විශ්වාසය ගොඩනගයි. නවීකරණය කරන ලද විගණන භාවිතයන් සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා සහාය වන අතර රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට දායක වේ.

සියලුම රාජ්‍ය ආයතනවල ඵලදායී අභ්‍යන්තර විගණන යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම අරමුණු කරන 2024 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වන වගන්තියට අනුකූලව, මෙම ප්‍රතිසංස්කරණමය උපායමාර්ගික සැලැස්ම 2026 - 2030 කාලය සඳහා අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිසංස්කරණ මූලපිරීම් ගෙනහැර දක්වයි.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වන වගන්තියේ සාරාංශය

2024 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වන වගන්තිය රාජ්‍ය ආයතන තුළ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ අවධානය යොමු කර ඇත. එය පහත ප්‍රධාන කරුණු ගෙනහැර දක්වයි.

- **අභ්‍යන්තර විගණකවරුන්ගේ ස්වාධීනත්වය**: අභ්‍යන්තර විගණකවරුන් ස්වාධීනව ක්‍රියා කළ යුතු අතර බැඳියාවන් අතර ගැටුමකට තුඩු දිය හැකි රාජකාරි ඔවුන්ට පැවරිය යුතු නොවේ.
- **වාර්තා කිරීමේ වගකීම**: අභ්‍යන්තර විගණකවරුන් විසින් විගණන සොයාගැනීම් අදාළ රාජ්‍ය ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, ගණන්දීමේ නිලධාරියා හෝ පාලන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාවල පිටපත් **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **40** සහ **41** වගන්තිවලට අනුකූලව විගණන කළමනාකරණය සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුවට ද යොමු කළ යුතුය.
- **නියෝග අධිකාරිය**: අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර විගණනය සහ විගණන කළමනාකරණ කමිටු ශක්තිමත් කිරීම අරමුණු කරගෙන රාජ්‍ය ආයතන වෙත නියෝග නිකුත් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට බලය ඇත.

2.4 ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ප්‍රතිසංස්කරණ සමඟ පෙළගැස්වීම

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික දිශානතිය ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සමඟ සමීපව සමපාත වේ. අභ්‍යන්තර විගණන පාලනය වැඩිදියුණු කිරීම, වගවීම ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය අධීක්ෂණය වැඩිදියුණු කිරීම මගින්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව යහ පාලනය, කාර්යක්ෂම රාජ්‍ය සේවා සැපයීම සහ තිරසාර මූල්‍ය කළමනාකරණය වැනි ප්‍රධාන ප්‍රතිපත්තිමය අරමුණු ළඟා කර ගැනීම සඳහා සහාය වේ. මෙම උත්සාහයන් ජාතික ප්‍රතිපත්ති රාමුවේ සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීමට ඍජුවම දායක වන අතර, සමාවේශී (**Inclusive**) සහ සාධාරණ සංවර්ධනයක් ඇති කිරීම සඳහා රාජ්‍ය සම්පත් විනිවිදභාවයෙන් හා ඵලදායී ලෙස කළමනාකරණය කරන බව සහතික කරයි.

3. දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම්

දැක්ම: රාජ්‍ය අංශයේ වගවීම සහ කාර්ය සාධනය සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් ශක්තිමත් කිරීමේ ප්‍රමුඛතම ආයතනය වීම.

මෙහෙවර: අභ්‍යන්තර විගණන ඒකක සඳහා උපායමාර්ගික මඟ පෙන්වීම, අධීක්ෂණය සහ ධාරිතා සංවර්ධනය සිදු කිරීම සහ රාජ්‍ය ආයතන තුල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.”

මූලික වටිනාකම්: අඛණ්ඩතාව | ස්වාධීනත්වය | වෘත්තීයභාවය | විනිවිදභාවය | නවෝත්පාදනය | සහයෝගිතාවය

4. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන්

I. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, විශේෂ වියදම් ඒකක සහ පළාත් සභාවල අභ්‍යන්තර විගණකවරුන්ට මග පෙන්වීම.

II. භාණ්ඩාගාරය නියෝජනය කරමින් විගණන සහ කළමනාකරණ කමිටු (AMC) රැස්වීම් පැවැත්වීම සහ ඒවාට සහභාගී වීම.

III. අභ්‍යන්තර විගණන කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම.

IV. අභ්‍යන්තර විගණන ආකෘතිමය රාමු, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ ලබා දීම.

V. අවශ්‍ය විටෙක විශේෂ විමර්ශන සහ සමාලෝචන පැවැත්වීම.

VI. අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කර විගණන ධාරිතාව ගොඩනැංවීම.

VII. සන්නිවේදනය සහ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කර වැඩිදියුණු කිරීම.

VIII. විගණකාධිපති සහ ජාත්‍යන්තර හවුල්කරුවන් වැනි බාහිර කොටස්කරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම.

5. ප්‍රතිසංස්කරණමය උපායමාර්ගික ඉලක්ක සහ අරමුණු

සමස්ත අරමුණ: අභ්‍යන්තර විගණන කාර්යයන් ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයතනවල වැඩිදියුණු කළ මූල්‍ය කළමනාකරණ පිළිවෙත් සහතික කිරීම, එමඟින් මූල්‍ය විනය ප්‍රවර්ධනය කිරීම, අක්‍රමිකතා අවම කිරීම සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

අභ්‍යන්තර විගණන පද්ධති, අවදානම් කළමනාකරණය, ඩිජිටල්කරණය සහ පාලන වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වන වගන්තියට ආයතනික අනුකූලතාවය සහතික කිරීම සඳහා 2026–2030 කාලය තුළ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට නියමිත උපායමාර්ගික ප්‍රතිසංස්කරණ මුලපිරීම් පහත වගුවේ දක්වා ඇත.

උපායමාර්ගික ඉලක්ක	අරමුණු	ප්‍රධාන මුලපිරීම්
ඉලක්කය 1 රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණන පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම	(i) අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ සහ අත්පොත් ආදිය සමාලෝචනය කර යාවත්කාලීන කිරීම. (ii) 2028 වන විට සියලුම රජයේ ආයතන අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලසුම් අනුගමනය කරන බවට සහතික වීම.	(i) නව අභ්‍යන්තර විගණන රාමුවක් සහ චක්‍රලේඛයක් සංවර්ධනය කර නිකුත් කිරීම. (ii) අවදානම් පාදක සැලසුම්කරණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම. (iii) වෙබ් පද්ධතිය හරහා අභ්‍යන්තර විගණන වාර්තා අධීක්ෂණය කර ඇගයීමට ලක් කිරීම.

ඉලක්කය 2: ව්‍යාපෘතිය විගණන කළමනාකරණ කමිටු ඇතුළුව විගණන හා කළමනාකරණ කමිටු වල සඵලදායිතාව වැඩි දියුණු කිරීම.	(i) සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අවම වශයෙන් කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන බවට සහතික වීම. (ii) **2026** වන විට ප්‍රමිතිගත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාකරණ සැකිලි සහ ප්‍රොටෝකෝල සංවර්ධනය කිරීම.	(i) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වීමට පුහුණු නිලධාරීන් යෙදවීම. (ii) වෙබ් පද්ධතිය හරහා විගණන කළමනාකරණ කමිටු කාර්ය සාධන අධීක්ෂණ (Dash Board) පුවරුවක් සකස් කිරීම. (iii) වාර්ෂික විගණන හා කළමනාකරණ කමිටු කාර්යසාධන වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම.
ඉලක්කය 3: අභ්‍යන්තර විගණකවරුන්ගේ ධාරිතා සංවර්ධනය සහ වෘත්තීයභාවය ගොඩනැගීම.	(i) **2030** වන විට මූලික හා ඉස්මතු වෙමින් පවතින විගණන ක්ෂේත්‍ර පිළිබඳව අවම වශයෙන් අභ්‍යන්තර විගණකවරුන් **250** දෙනෙකු පුහුණු කිරීම. (ii) රජයේ අභ්‍යන්තර විගණකවරුන් සඳහා සහතික කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම.	(i) තොරතුරු තාක්ෂණ විගණනය, කාර්ය සාධන විගණනය, අවදානම් කළමනාකරණය ආදිය පිළිබඳ නිරන්තරයෙන් වැඩමුළු පැවැත්වීම. (ii) දේශීය සහ විදේශීය පුහුණු සපයන්නන් සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම. (iii) දෙපාර්තමේන්තු වෙබ් අඩවියට සම්බන්ධ විද්‍යුත් ඉගෙනුම් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම (E-learning Platform).
ඉලක්කය 4: අභ්‍යන්තර විගණන පද්ධති ඩිජිටල්කරණය වැඩි දියුණු කිරීම	(i) **2027** වන විට විගණන වාර්තාකරණ වෙබ් පද්ධතිය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම (ii) **2028** වන විට අවදානම් ලේඛන සහ විගණන කාර්යසාධන අධීක්ෂණ (Dash Board) පුවරු ඒකාබද්ධ කිරීම	(i) මාර්ගගත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාකරණය, කාර්ය සාධන දර්ශක සහ විගණන ලුහුබැඳීම් සඳහා මොඩියුල එක් කිරීම. (ii) අභ්‍යන්තර විගණකවරුන් සඳහා පරිශීලක අත්පොත් සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
ඉලක්කය 5: කාලීන හා සඵලදායී විමර්ශන සිදු කිරීම සහතික කිරීම	(i) වැඩ කරන දින **10**ක් ඇතුළත විශේෂ විමර්ශන ආරම්භ කිරීම සඳහා කඩිනම් ප්‍රොටෝකෝලයක් සකස් කිරීම (ii) **2030** වන විට විශේෂ සමාලෝචන ආවරණය සියයට **25** කින් වැඩි කිරීම	(i) පුහුණු නිලධාරීන්ගෙන් සමන්විත විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම (ii) කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය දීම සහ වාර්තා කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි **(SOP)** සකස් කිරීම

ඉලක්කය 6: ආයතනික ශක්තිමත්කරණය සහ උපායමාර්ගික සහභාගීත්වය සඳහා	(i) දෙපාර්තමේන්තුවේ සංවිධානාත්මක රාමුව ප්‍රතිව්‍යුහගත කිරීම (ii) **2026** වන විට දෙපාර්තමේන්තු මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම (iii) අධීක්ෂණ සහ විගණන ආයතන සමඟ හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීම	(i) ප්‍රධාන කාර්යයන් සඳහා කැපවූ ඒකක පිහිටුවීම (ii) අභ්‍යන්තර ධාරිතාව ක්‍රියාත්මක කිරීම සැලසුම් නිර්මාණය (iii) වාර්ෂික ජාතික අභ්‍යන්තර විගණන සමුළුවක් පැවැත්වීම (iv) කලාපීයව දැනුම බෙදා ගැනීමේ වැඩසටහන් සඳහා සහභාගී වීම
ඉලක්කය 7: රාජ්‍ය ගිණුම් කාරක සභා සහභාගීත්වය ශක්තිමත් කිරීම	(i) විගණන කළමණාකරණ රැස්වීම්වලින් අදාළ අවබෝධයන් ක්‍රමානුකූලව ග්‍රහණය කර රාජ්‍ය ගිණුම් කාරක සභා ක්‍රියාදාමයන් සඳහා වාර්තා කර ඇති බව සහතික කිරීම. (ii) **2027** වන විට දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තු කමිටු අතර නිරන්තර තොරතුරු හුවමාරුව සඳහා රාමුවක් සකස් කිරීම.	(i) විගණන කළමණාකරණ කමිටු රැස්වීම් වලදී හඳුනාගත් ප්‍රධාන අවදානම්, පාලන හිඩැස් සහ අනුකූලතා ගැටළු සාරාංශ කිරීම සඳහා ව්‍යුහගත වාර්තාකරණ සැකිල්ලක් සකස් කිරීම. (ii) රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු සාකච්ඡා සඳහා සහාය වන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ කාර්තුමය සාරාංශ හුවමාරු කර ගැනීම. (iii) රාජ්‍ය ගිණුම් කාරක සභා වලට අදාල නිරීක්ෂණ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදී හඳුනා ගැනීමට හැකිවන පරිදි අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම. (iv) ප්‍රධාන අධීක්ෂණ ආයතන (රාජ්‍ය ගිණුම් කාරක සභාව, ජාතික විගණන කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය) වෙත ප්‍රවේශ විය හැකි විගණන කළමනාකරණ කමිටු සොයාගැනීම්වල ආරක්ෂිත ලේඛනාගාරයක් සකස් කිරීම.

6. උපායමාර්ගික අවදානම් කළමනාකරණ රාමුව

2026-2030 ප්‍රතිසංස්කරණමය උපායමාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් උපායමාර්ගික අවදානම් කළමනාකරණ රාමුවක් අනුගමනය කරයි. මෙම රාමුව උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපෑම් කළ හැකි අවදානම් කල්තියා හඳුනාගෙන, තක්සේරු කර කළමනාකරණය කරයි.

6.1 අවදානම් පාලන ව්‍යුහය

උපායමාර්ගික සැලැස්මට අදාළ අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ අවධානම් අවම කිරීම අධීක්ෂණය කිරීම සඳහා උපායමාර්ගික අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කෙරේ. එම කමිටුව අධ්‍යක්ෂ ජනරාල් වෙත සෘජුවම වාර්තා කරන අතර උපායමාර්ගික අවදානම් නිරාවරණය පිළිබඳ කාර්තුමය සමාලෝචන පවත්වනු ඇත.

6.2 උපාය මාර්ග සංවර්ධනය සමඟ ඒකාබද්ධ වීම

සියලුම උපායමාර්ගික ඉලක්ක සඳහා අවදානම් තක්සේරු කර ක්‍රියාත්මක කිරීමේ අනුකෘතියට (Matrix) ඇතුළත් කර ඇත. ප්‍රතිරෝධී **(Resilient)** සහ අනුවර්තනීය **(Adaptive)** ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සෑම උපායමාර්ගික අරමුණකටම අදාළ අවදානම් සහ අවම කිරීමේ උපාය මාර්ග ඇතුළත් කර ඇත.

6.3 අවදානම් කළමනාකරණ ප්‍රවේශය

- **අවදානම්**: වෙනස් වීමට ප්‍රතිරෝධය, අයවැය සීමාවන්, විගණනයට ලක්වන්නන්ගේ සහයෝගීතාවය නොමැතිකම.

- **අවම කිරීමේ සැලැස්ම**: භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපත්තිමය සහාය, පාර්ශවකරුවන් දැනුවත් කිරීම, අදියරෙන් අදියර එළිදැක්වීම, හවුල්කරුවන්ගෙන් අරමුදල් සහාය.

6.4 උපායමාර්ගික අවදානම් අනුකෘතිය (Strategic Risk Matrix)

කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි ප්‍රධාන අවදානම් සහ එම අවධානම් අවම කිරීමේ පියවර සමඟ ඇති විය හැකි හේතුව සහ බලපෑම (Cause & Impact) පහත දැක්වේ. 2026-2030 කාලපරිච්ඡේදය සඳහා අභ්‍යන්තර විගණන උපාය මාර්ගය උපායමාර්ගගත කිරීමේදී මේ සියල්ල ආවරණය කර ඇති අතර මෙම එක් එක් අවදානම් පහත අවදානම් වගුවේ විස්තර කර ඇති පරිදි උපාය මාර්ගයට අදාලව සිතියම්ගත කර ඇත.

විස්තරය			අවදානම් මට්ටම	අවම කිරීමේ උපාය මාර්ගය	අදාළ ඉලක්කය සමඟ ප්‍රධාන සම්බන්ධතාවය
අවදානම් කලාපය	හේතුව	බලපෑම			
ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම	පුහුණුව සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම.	ධාරිතා වර්ධනය සහ අනෙකුත් මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම	ඉහළ	බාහිර අරමුදල් **(UNDP)** සම්පාදනය: අදියර වශයෙන් ප්‍රතිපාදන ඉල්ලීම්	ඉලක්කය අංක **3**
ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිරෝධය	විගණනීය පාර්ශවයන්ගේ සහයෝගීතාවය නොමැතිකම	විගණන කළමණාකරන කමිවු සහ අභ්‍යන්තර විගණන ප්‍රතිසංස්කරණ සඳහා අනුකූල නොවීම සහ සහාය නොමැතිකම	ඉහළ	දැනුවත් කිරීමේ සහ උපදේශන වැඩසටහන් පැවැත්වීම	ඉලක්කය අංක **2**
තොරතුරු තාක්ෂණය මත පද්ධති අවදානම	ප්‍රසම්පාදනයේ හෝ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්	ඩිජිටල් පද්ධති නවීකරණය කිරීම් නියමිත වේලාවට සම්පූර්ණ කර නොමැත.	ඉහළ	ප්‍රසම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. පළපුරුදු සේවා සපයන්නන් බඳවා ගැනීමට තීරණය කිරීම	ඉලක්කය අංක **4**
ධාරිතා අවදානම	අභ්‍යන්තර විගණකවරුන්ගේ ඉහළ පිරිවැටුම	විගණන සඵලදායීතාවය සහ ආයතනික මතකය (Institutional Memory) අඩු කරයි	ඉහළ	රඳවා ගැනීමේ දිරිගැන්වීම් ඇති කිරීම. අඛණ්ඩ පුහුණුව	ඉලක්කය අංක **3**
තොරතුරු පරතරය	කළමණාකරණ විගණන කමිටු සොයාගැනීම් අධීක්ෂණ ආයතන වෙත ප්‍රමාණවත් පරිදි වාර්තා නොකිරීම.	රාජ්‍ය ගිණුම් කාරක සභාව වැනි අධීක්ෂණ ආයතනවලට අසම්පූර්ණ තොරතුරු ලැබීම	ඉහළ	රාජ්‍ය ගිණුම් කාරක සභා ලේකම් කාර්යාලය සමඟ සන්නිවේදන ප්‍රොටෝකෝලය විධිමත් කිරීම	ඉලක්කය අංක **2**
කාර්ය මණ්ඩල හිඟය	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු වෙහි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිකම	අකාර්යක්ෂමතාව; අඛණ්ඩ අඩු කාර්ය මණ්ඩලය සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය හැකිය	ඉහළ	කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය සහ තාක්ෂණය භාවිතය වැඩි කිරීම	සියල්ල

සම්බන්ධීකරණ අවදානම	අදාළ ආයතන සමඟ දුර්වල සම්බන්ධීකරණය	විගණන පසු විපරම් වලදී පුනරාවර්තන උත්සාහයන් හෝ හිඩැස් (gaps)	මධ්‍යම	නිරන්තර සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම	ඉලක්කය අංක 6
කීර්තිනාමය පිළිබඳ අවදානම	පාර්ලිමේන්තු අධීක්ෂණයට සහාය වීමේ අවස්ථාව අහිමි වීම.	විගණන කාර්යයේ ප්‍රයෝජනවත් බව පිළිබඳ විශ්වාසය නැතිවීම	ඉහළ	රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත වාර්තා කිරීම සඳහා ව්‍යුහගත වාර්තාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම	ඉලක්කය අංක 2

7. අධීක්ෂණ සහ ඇගයීම් රාමුව

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක වෙත සම්බන්ධ කිරීම.

(ii) කාර්යසාධන දර්ශක (KPI) සහ කාර්ය සාධන ලකුණු කාඩ්පත් (scorecards) හඳුන්වා දීම.

(iii) 2028 දී මධ්‍ය කාලීන සමාලෝචනයක් පැවැත්වීම.

(iv) වාර්ෂිකව ඇල්මක් ඇති පාර්ශවකරුවන්ගේ වාර්තා සහ ප්‍රතිපෝෂණ සැසි පැවැත්වීම.

(v) අවදානම් දර්ශක කාර්තුමය වශයෙන් නිරීක්ෂණය කිරීමට සහ ඒ අනුව අවම කිරීමේ සැලසුම් සංශෝධනය කිරීමට උපායමාර්ගික අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීම.

(vi) අවශ්‍ය පරිදි උපාය මාර්ග සකස් කිරීම සඳහා 2028 දී මධ්‍ය කාලීන උපායමාර්ගික අවදානම් තක්සේරුවක් පැවැත්වීම.

8. 2030 වන විට අපේක්ෂිත ප්‍රතිඵල

- රාජ්‍ය ආයතන තුල අභ්‍යන්තර විගණන පද්ධති සම්පූර්ණයෙන්ම ආයතනිකකරණය සිදු කිරීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වන වගන්තියට අනුකූල වීමේ සැලකිය යුතු වර්ධනයක් ලබා කර ගැනීම
- මූල්‍ය වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම
- ඩිජිටල් විගණන මෙවලම් සහ භාවිතයන් පුළුල් ලෙස භාවිතා කිරීම
- ඉහළ කුසලතා ඇති සහ වෘත්තීය අභ්‍යන්තර විගණන ශ්‍රම බලකායක් බිහි කිරීම
- ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇති කිරීම
- රාජ්‍ය වියදම්වල මුදලට වටිනාකමක් සහතික කිරීම

9. 2026-2030 කාලපරිච්ඡේදය සඳහා අයවැය සාරාංශය (දර්ශක)

ප්‍රධාන ක්‍රියාකාරකම	මුළු අයවැය ඇස්තමේන්තුව (රු. මිලියන)
ධාරිතා සංවර්ධන වැඩසටහන්	
මෘදුකාංග වැඩිදියුණු කිරීම්	
ප්‍රකාශනය සහ සන්නිවේදනය	
විශේෂ සමාලෝචන සහ විමර්ශන	

10. ඇමුණුම්

1. SWOT විශ්ලේෂණය
2. පාර්ශවකරුවන්ගේ සිතියම
3. ක්‍රියාත්මක කිරීමේ අනුකෘතිය
4. ප්‍රධාන කාර්ය සාධන දර්ශක
5. පුහුණු දින දර්ශන දළ සටහන
6. සංවිධාන ව්‍යුහය (යෝජිත වැඩිදියුණු කිරීම්)

ඇමුණුම 1

SWOT විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා	අවස්ථා	තර්ජන
• භාණ්ඩාගාරය සහ මුදල් රෙගුලාසි මඟින් ලබා දෙන අධිකාරිය	• කාර්යයන්ට සාපේක්ෂව සීමිත කාර්යය මණ්ඩලය	• වර්ධනය වන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සඳහා සහයෝගීතාවය	• විගණිත පාර්ශවයන්ගෙන් ප්‍රතිසංස්කරණවලට ඇති ප්‍රතිරෝධය
• ආයතනික දැනුම ඇති පළපුරුදු නිලධාරීන්	• පුහුණුව සහ තාක්ෂණ වැඩිදියුණු කිරීම් සඳහා අයවැය සීමාවන්	• සංවර්ධන හවුල්කරුවන්ගෙන් සහාය	• දේශපාලන බලපෑම හෝ සහයෝගීතාවය නොමැතිකම
• අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මධ්‍යගතව සම්බන්ධීකරණය කිරීම	• ආයතන අතර විගණන ගුණාත්මකභාවයේ අසමානතාවය	• අවදානම් කළමනාකරණය රාජ්‍ය පද්ධතිවලට ඒකාබද්ධ කිරීම	• අනුරූප කුසලතා නොමැති වීම හේතුවෙන් තාක්ෂණික බාධා වීම්
• පවතින වෙබ් පාදක විගණන වාර්තාකරණ වේදිකාව (Platform)	• සීමිත දත්ත විශ්ලේෂණ සහ තොරතුරු තාක්ෂණ විගණන හැකියාවන්	• විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම සඳහා ඉල්ලුම	• පුහුණු අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ පිරිවැටුම

ඇමුණුම 2

පාර්ශවකරුවන්ගේ සිතියම

පාර්ශවකරු	**භූමිකාව / උනන්දුව**	**නියැලීමේ උපාය මාර්ගය**
මුදල් අමාත්‍යාංශය / භාණ්ඩාගාරය	අධීක්ෂණය, අනුමැතිය, අරමුදල් සැපයීම	අඛණ්ඩව කෙටි විස්තර සැපයීම, වාර්තා කිරීම, ප්‍රතිසංස්කරණ පිළිබඳ සහයෝගීතාවය
අභ්‍යන්තර විගණන ඒකක	විගණන සැලසුම්වල ප්‍රධාන ක්‍රියාත්මක කරන්නන්	පුහුණුව, ධාරිතා වර්ධනය, මාර්ගෝපදේශ සහාය
ජාතික විගණන කාර්යාලය	බාහිර විගණන සහයෝගීතාව	විධිමත් සම්බන්ධීකරණය, හවුල් විගණන නිරීක්ෂණ
සංවර්ධන හවුල්කරුවන්	මූල්‍ය හා තාක්ෂණික සහාය	යෝජනා සංවර්ධනය, වාර්තාකරණය, හවුල්කාරිත්වයන්
රාජ්‍ය ගිණුම් කාරක සභාව	වගවීම පිළිබඳ පසු විපරම	විගණන කළමනාකරණ කමිටු වාර්තා, උපායමාර්ගික කෙටි විස්තර බෙදා ගැනීම
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය / CIASL	විගණන පුහුණු ආයතන	පුහුණු කිරීමේ හවුල්කාරිත්වය
තොරතුරු තාක්ෂණ සංවර්ධකයින් / උපදේශකයින්	පද්ධති සංවර්ධනය සහ සහාය	කොන්ත්‍රාත්කරණය, කාර්ය නියමාවලිය (TORs), පද්ධති ඇගයීම්

අරමුණු	ප්‍රධාන මුල පිරීම්	කාලරාමුව					වගකීම
		2026	2027	2028	2029	2030	
උපායමාර්ගික ඉලක්කය **1:** රාජ්‍ය අංශය පුරා අභ්‍යන්තර විගණන පාලනය ශක්තිමත් කිරීම							
2027 වන විට අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ සහ අත්පොත් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම. 2028 වන විට රජයේ ආයතනවලින් සියලුම අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලසුම් අනුගමනය කරන බවට සහතික වීම.	(i) නව අභ්‍යන්තර විගණන රාමුවක් සහ චක්‍රලේඛයක් සකස් කර නිකුත් කිරීම (ii) අවදානම් පාදක සැලසුම්කරණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම (iii) වෙබ් පද්ධතිය හරහා අභ්‍යන්තර විගණන වාර්තා නිරීක්ෂණය කර ඇගයීම						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
උපායමාර්ගික ඉලක්කය **2:** ව්‍යාපෘති විගණන කළමනාකරණ කමිටු ඇතුළුව විගණන කළමනාකරණ කමිටු වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම							
සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අවම වශයෙන් කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන බවට සහතික වීම. 2026 වන විට ප්‍රමිතිගත විගණන හා කළමනාකරණ කමිටු වාර්තාකරන සැකිලි සහ ප්‍රොටෝකෝල සංවර්ධනය කිරීම	(i) විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා පුහුණු නිලධාරීන් යෙදවීම. (ii) වෙබ් පද්ධතිය හරහා විගණන කළමනාකරණ කමිටු කාර්යසාධන අධීක්ෂණ පුවරුවක් සැකසීම. (iii) වාර්ෂික විගණන හා කළමනාකරණ කමිටු කාර්ය සාධන වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
උපායමාර්ගික ඉලක්කය **3:** ධාරිතාව සහ වෘත්තීයභාවය ගොඩනැගීම							
2030 වන විට මූලික හා ඉස්මතු වෙමින් පවතින විගණන ක්ෂේත්‍ර පිළිබඳව අවම වශයෙන් අභ්‍යන්තර	(i) තොරතුරු තාක්ෂණ විගණනය, කාර්ය සාධන විගණනය, අවදානම් කළමනාකරණය ආදිය පිළිබඳ නිරන්තර වැඩමුළු පැවැත්වීම.						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

විගණකවරුන් 250 ක් පුහුණු කිරීම. රජයේ අභ්‍යන්තර විගණකවරුන් සඳහා සහතික කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම.	(ii) දේශීය හා විදේශීය පුහුණු සපයන්නන් සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම (iii) දෙපාර්තමේන්තු වෙබ් අඩවියට සම්බන්ධව විද්‍යුත් ඉගෙනුම් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම.						
උපායමාර්ගික ඉලක්කය **4:** අභ්‍යන්තර විගණන පද්ධති ඩිජිටල්කරණය වැඩිදියුණු කිරීම							
2027 වන විට විගණන වාර්තාකරණ වෙබ් පද්ධති වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම.	(i) මාර්ගගත විගණන හා කළමනාකරණ කමිටු වාර්තාකරණය, කාර්ය සාධන දර්ශක සහ විගණන ලුහුබැඳීම (Audit Hacking) සඳහා මොඩියුල එක් කිරීම.						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ අංශය
2028 වන විට අවදානම් ලේඛන සහ විගණන කාර්ය සාධන අධීක්ෂණ පුවරු ඒකාබද්ධ කිරීම.	(ii) අභ්‍යන්තර විගණකවරුන් සඳහා පරිශීලක අත්පොත් සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීම.						
උපායමාර්ගික ඉලක්කය **5:** සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව කාලෝචිත හා ඵලදායී විමර්ශන සහතික කිරීම							
වැඩ කරන දින 10ක් ඇතුළත විශේෂ විමර්ශන ආරම්භ කිරීම සඳහා කඩිනම් ප්‍රොටෝකෝලයක් සකස් කිරීම. 2030 වන විට විශේෂ සමාලෝචන ආවරණය සියයට 25 කින් වැඩි කරන්න.	(i) පුහුණු නිලධාරීන්ගෙන් යුත් විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම (ii) කාර්යයන් ප්‍රමුඛතාවය සහ වාර්තා කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සකස් කිරීම						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
උපායමාර්ගික ඉලක්කය **6:** ආයතනික ශක්තිමත් කිරීම සහ උපායමාර්ගික සහභාගීත්වය							
දෙපාර්තමේන්තුවේ සංවිධාන රාමුව ප්‍රතිව්‍යුහගත කිරීම.	(i) ප්‍රධාන කාර්යයන් සඳහා වෙන්වූ ඒකක පිහිටුවීම						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

2026 වන විට දෙපාර්තමේන්තු මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම. අධීක්ෂණ සහ විගණන ආයතන සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම	(ii) අභ්‍යන්තර ධාරිතා වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම (iii) වාර්ෂික ජාතික අභ්‍යන්තර විගණන සමුළුවක් පැවැත්වීම (iv) කලාපීය දැනුම බෙදාගැනීමේ වේදිකාවල සහභාගී වීම						
උපායමාර්ගික ඉලක්කය **7: COPA** සහභාගීත්වය ශක්තිමත් කිරීම							
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලින් ලැබෙන අදාළ අවබෝධයන් ක්‍රමානුකූලව ග්‍රහණය කර රාජ්‍ය ගිණුම් කාරක සභා ක්‍රියාදාමයන් සඳහා වාර්තා කිරීම සහතික කිරීම.	(i) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී හඳුනාගත් ප්‍රධාන අවදානම්, පාලන හිඩැස් සහ අනුකූලතා ගැටළු සාරාංශ කිරීම සඳහා ව්‍යුහගත වාර්තාකරණ සැකිල්ලක් සකස් කිරීම. (ii) රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) සාකච්ඡා සඳහා සහාය වීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ කාර්තුමය සාරාංශ බෙදා ගැනීම.						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
2027 වන විට දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තු කමිටු අතර නිරන්තර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා රාමුවක් සකස් කිරීම.	(iii) රාජ්‍ය ගිණුම් කාරක සභාවට අදාල නිරීක්ෂණ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අතරතුර හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම. (iv) ප්‍රධාන අධීක්ෂණ ආයතනවලට (රාජ්‍ය ගිණුම් කාරක සභාව, ජාතික විගණක කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය (MOF)) ප්‍රවේශ විය හැකි ආකාරයට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලින් සොයාගත් දත්ත ආරක්ෂිත ලේඛනාගාරයක ගබඩා කිරීම.						

ඇමුණුම 4

ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs)

2026–2030 ප්‍රතිසංස්කරණයේ උපායමාර්ගික සැලැස්මේ සාර්ථකත්වය නිරීක්ෂණය කිරීමට සහ ඇගයීමට පහත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) භාවිතා කරනු ඇත.

උපායමාර්ගික ඉලක්කය	KPI	
අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම හා පාලනය	අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් භාවිතා කරන ආයතනවල ප්‍රතිශතය	100 %
	යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර විගණනය රාමුව සහ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම	2027 වර්ෂය වන විට සම්පූර්ණ කිරීම
ධාරිතාව ගොඩනැගීම	පුහුණු කරන ලද අභ්‍යන්තර විගණකවරුන් සංඛ්‍යාව	>250
	පුහුණු ප්‍රතිපෝෂණ වලින් ලබා ගත් තෘප්තිමත් අනුපාතය	සියයට 85 ට වැඩි
ඩිජිටල් වේදිකාව වැඩිදියුණු කිරීම	මාර්ගගතව වාර්තා ඉදිරිපත් කරන ආයතන ගණන	100 %
	අවදානම් සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මොඩියුල සමඟ වෙබ් පාදක පද්ධතිය වැඩි දියුණු කිරීම	2027 වන විට සම්පූර්ණ කිරීම
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම	කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ආයතනවල ප්‍රතිශතය	90%
	වාර්ෂික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල කාර්ය සාධන වාර්තා ප්‍රකාශයට පත් කිරීම	වාර්ෂිකව
විමර්ශන	විශේෂ විමර්ශනයක් ආරම්භ කිරීමට ගතවන සාමාන්‍ය කාලය	වැඩ කරන දින 10ක් ඇතුළත
	වාර්ෂිකව සම්පූර්ණ කරන ලද විමර්ශන ගණන	>20

උපායමාර්ගික නියැලීම	ප්‍රතිපත්තිමය සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් ගණන	අවම වශයෙන් 10 ක්
පාර්ලිමේන්තු අධීක්ෂණ දායකත්වය	රාජ්‍ය ගිණුම් කාරක සභා භාවිතය සඳහා ඉදිරිපත් කරන ලද කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සාරාංශ වාර්තා	100%
	රාජ්‍ය ගිණුම් කාරක සභාවට අදාළ වාර්තාකරණය පිළිබඳ පුහුණු සැසි පැවැත්වීම	වාර්ෂිකව සැසි 2ක්

ඇමුණුම 5

පුහුණු දින දර්ශන දළ සටහන (2026–2030)

පුහුණු තේමාව	ඉලක්ක කණ්ඩායම	මාදිලිය	කාල රාමුව					සහයෝගිතාකරුවන්
			2026	2027	2028	2029	2030	
අවදානම් මත පදනම් වූ අභ්‍යන්තර විගණනය	අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය - අමාත්‍යාංශ	පුද්ගලිකව / zoom						පුහුණු සේවා සපයන්නන්
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රොටෝකෝල	අමාත්‍යාංශ ලේකම් කාර්යාල	වැඩමුළු						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, පුහුණු සපයන්නන්
තොරතුරු තාක්ෂණ සහ දත්ත විගණනයේ විශ්ලේෂණ	තෝරාගත් අභ්‍යන්තර විගණන කවයන් හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය	දෙමුහුන්						පුහුණු සේවා සපයන්නන්
කාර්ය සාධනය සහ පාරිසරික විගණන	ජ්‍යේෂ්ඨ අභ්‍යන්තර විගණකවරුන්	සම්මන්ත්‍රණ						පුහුණු සේවා සපයන්නන්
ආචාර ධර්ම සහ ස්වාධීනත්වය	සියලුම අභ්‍යන්තර විගණකවරුන්	විද්‍යුත් ඉගෙනුම්						පුහුණු සේවා සපයන්නන්
විගණන වාර්තා ලිවීම සහ සන්නිවේදනය	අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය	ප්‍රාදේශීය වැඩමුළුව						කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

ඇමුණුම 6

යෝජිත සංවිධාන ව්‍යුහය (වැඩිදියුණු කළ)



පරිච්ඡේදය 08 - මානව සම්පත් පැතිකඩ

8.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2025.12.31 දිනට)

	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	17	12	05
තෘතීයික	-	-	-
ද්විතියික	23	21	02
ප්‍රාථමික	10	06	04

8.2** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාරය

- **ජ්‍යෙෂ්ඨ :** පුරප්පාඩු 05 ක් පැවතියද අනෙකුත් නිලධාරීන් රාජකාරී ආවරණය කරන ලද බැවින් ආයතනයේ කාර්ය සාධනයට විශාල බලපෑමක් ඇති නොවන පරිදි කාර්යයන් කළමනාකරණය කරගත හැකිවිය.

- **ද්විතියික :** පුරප්පාඩු 02 ක් පැවතියද අනෙකුත් නිලධාරීන් රාජකාරී ආවරණය කරන ලද බැවින් ආයතනයේ කාර්ය සාධනයට විශාල බලපෑමක් ඇති නොවිය.

- **ප්‍රාථමික :**

  - **රියදුරු :** ආයතනයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් රියදුරෙකු 2025.10.29 වන දින අනුයුක්ත කරනු ලැබූ අතර සංචිත වාහන සඳහා ආයතනයේ එක් රියදුරකු යෙදවූ බැවින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා රියදුරන්ගේ පුරප්පාඩු බලපා නැත.

8.3 මානව සම්පත් සංවර්ධනය (විදේශ පුහුණු වැඩසටහන්)

නිලධාරියාගේ නම	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.374.005.08)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
				දේශීය	විදේශීය		
01. පී.ඩී හේමන්ති දාබරේ මිය - අධ්‍යක්ෂ (වැ.බ)	Public Expenditure Management	01	2025.11.10 - 2025.11.21	රු.108,893.03	-	විදේශීය	ඩිජිටල් පද්ධති ඒකාබද්ධ කිරීම. ප්‍රසම්පාදන නවීකරණය. ශක්තිමත් යෝජනා ක්‍රම තක්සේරුව. වැඩිදියුණු කළ වගවීම සහ වැඩිදියුණු කළ ප්‍රතිලාභීන් ඉලක්ක කිරීම මගින් ශ්‍රී ලංකාවට රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාව. විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කළ හැකි බව.
02.ජේ.ඒ පෙරීඩ් මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar for young diplomats from the democratic socialist republic of Sri Lanka	01	2025.11.25 - 2025.12.08	රු.117,857්.3 3 රු. 30,602.75	-	විදේශීය	ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය. ජීවනෝපාය ඉහළ නැංවීම හා තාක්ෂණික සංවර්ධනය වේගවත් කිරීම සම්බන්ධ දැනුම
03. ටී.එච්.එන්.පී ද සිල්වා මිය- සංවර්ධන නිලධාරි	Audit of Digital Public Infrastructure	01	2025.11.12 - 2025.11.28	රු.116.651.97	-	විදේශීය	මෙම පුහුණුව මඟින් ඩිජිටල් පොදු යටිතල පහසුකම් විගණනය කිරීම සහ ප්‍රායෝගික පුහුණුවක් ලද අතර මෙයින් ශ්‍රී ලංකා රජයට ඩිජිටල් පොදු පද්ධති වල ආරක්ෂාව සහ තිරසර බව සහතික කිරීමට, පාලනය, වගවීම හා මහජන විශ්වාසය ශක්තිමත් වන අයුරින් ක්‍රියාකරන ආකාරය

8.4 මානව සම්පත් සංවර්ධනය (දේශීය පුහුණු වැඩසටහන්)

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.) 133,000/=		වැඩසටහනන ේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
රාජ්‍ය සේවයේ සංවිධාන ව්‍යුහය හා වැටුප් ක්‍රම	11	2025.02.19 2025.03.11	-		දේශීය	රාජ්‍ය සේවයේ සංවිධාන ව්‍යුහය හා වැටුප් ව්‍යුහය පිළිබඳ දැනුම
සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම	01	2025.03.17 2025.03.18	13,000/=		දේශීය	සිවිල් විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුම
රජයේ වාහන නඩත්තුව	01	2025.03.25	6,500/=		දේශීය	රජයේ වාහන පාලනය හා නඩත්තුව පිළිබඳ දැනුම
වැටුප් පරිවර්තනය	09	2025.04.10	-		දේශීය	වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ කුසලතාව
ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය	01	2025.08.15	6,500/=		දේශීය	ගිණුම් කටයුතු පිළිබඳ දැනුම
විධිමත් ලිපිගොනුකරණය	01	2025.05.29	14,000/=		දේශීය	විධිමත් ලිපිගොනුකරණය පිළිබඳ දැනුම

ගබඩා පාලනය	01	2025.06.04	6,500/=		**දේශීය**	විධිමත් ගබඩා පාලනය පිළිබඳ දැනුම
Data Analysis Using Ms Exell & Power BI	02	2025.06.18,19,20	40,000/=		**දේශීය**	Power BI මගින් දත්ත විශ්ලේෂණය පිළිබඳ දැනුම
කාර්යාල ක්‍රම	01	2025.09.02/03	12,000/=		**දේශීය**	කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම
ආදායම් බදු වගකීම ගණනය කිරීම	02	2025.10.17	28,000/=		**දේශීය**	ආදායම් බදු සකස් කිරීම පිළිබඳ දැනුම
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ හා රියදුරන්ගේ සංවර්ධනය	01	2025.11.19	6,500/=		**දේශීය**	ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය සඳහා වෘත්තීය සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික දැනුම

පරිච්ඡේදය 09 – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ /ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN –20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ.	භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) සහ DMA -1/2019 අනුව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත	අදාළ නොවේ.	භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අදාළ නොවේ.	භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන සැලැස්ම පිළියෙළ කර ඒ අනුව විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.4	මු.රෙ. 134 (3) අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අදාළ නොවේ.	මෙම දෙපාර්තමේන්තුවට අදාළව අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින්	

			දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරයි. ඒ අනුව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් එම අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අදාළ නොවේ.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබයි	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය අනුව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා හා ඌණතා සහ වෙනත් නිර්දේශ අදාල කාලය තුල ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහන වල අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසදීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ.		
15.3	මු.රෙ 176 ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම	අදාළ නොවේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරිම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුලින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරිමට ද පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අදාළ නොවේ.	2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 (i) 03 ඡේදය අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		